දුවේ පුතේ .... පහත ගීතය රසවත්ව තාලයට ගායනා කරන්න.

පිපි කුසුම වදුලු සිඹිමින්
තුරු සිරස ළපලු අතරින්
එන ළහිරු කිරණ මෙතරම්
සොඳුරු නැත
රජ මැඳුරුවල නම් . . . //

නද සමඟ අනෙක සියොතුන්
දිය පහස සිසිල විඳිමින්
මඳ පවන හමන දසතින්
සොඳුරු නැත
රජ මැඳුරුවල නම් . . . //

රජ මැඳුර සිපිරි ගෙයකි
ගම සොඳුරු තිදස පුරකී
මෙම සුවය නොවිඳි පෙර දී
ලැබුම මගෙ සසර පෙර පිනකී . . . //

සිරි පැරකුම් චිත්‍රපටයෙන්

**පරිසරයේ අසිරිය දැක්වෙන චිත්‍රයක් නිර්මාණය කරන්න.**

**පහත දැක්වෙන කතාව හොඳින් කියවන්න**

## කැකිල්ලේ රජතුමා නරින්ට කළ උපකාරය

එදා වැසි සහිත දිනයකි. කැකිල්ලේ රජතුමා දවසේ වැඩ කටයුතු නිම කර නින්දට ගියේ ය. හිටිහැටියේ ඇසුණු ශබ්දයක් නිසා රජතුමා අවදි විය. නරි සිය ගණනක් එකතු වී මහ හඬින් හූ කීම ඒ අධික ශබ්දයට හේතුව යි. ඒ බව නොදත් කැකිල්ලේ රජතුමා වහාම පුරෝහිතයා කැඳවී ය."පුරෝහිත මේ මහ රෑ ඇසුණු ශබ්දය කුමක් ද ? හූ කියන්නේ කවුරුන් ද? ඒ ශබ්දය මගේ නින්දට මහත් බාධාවකි." රජතුමා පුරෝහිතට පැවසුවේ ය. රජතුමා පැවසූ දෙයට යටි සිතින් සිනාසෙමින් පුරෝහිත මෙසේ පිළිතුරු දුන්නේ ය. " දේවයන් වහන්ස, ඒ හූ කියන්නේ නරි රැළකි. උන් කෑ ගසන්නේ වැස්සට තෙමී සීතලෙන් වෙවුලන නිසා ය. උන්ට නිවාස නැත. පෙරවීම සඳහා රෙදි ද නැත. නරි රැළ මෙසේ කෑ ගසා ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ නිවාසත්, රෙදිපිළිත් ය." රජතුමා නරි රැළ පිළිබඳ සොයා නොබැලීම ගැන කම්පාවට පත් විය. වහාම භාණ්ඩාගාරය භාර ඇමතිවරයා කැඳවී ය. මසුරන් දහසක් පුරෝහිතට ලබා දෙන ලෙස නියෝග කළේ ය."මේ මසුරන් දහස රැගෙන ගොස්, නරි රැළට අවශ්‍ය නිවාස සහ පෙරවීම සඳහා රෙදි ද වහා සපයනු" යැයි රජතුමා අණ කළේ ය. පුරෝහිත මසුරන් පොදිය ද රැගෙන සතුටින් තම නිවසට ගියේ ය.

නරි රැළට පිහිට වීමට හැකි වීම පිළිබඳ ව රජතුමා අපමණ සතුටට පත් විය. පුරෝහිත නරි රැළට නිවාස තනා දී රෙදිපිළි ද සපයා දෙන්නට ඇතැයි රජතුමා විශ්වාස කළේ ය. කාලයක් ගත විය. නැවත දිනයක මහ වැසි වැස්සේ ය. පෙර වැසි දිනයක සිදු වූ සිදු වීම මෙදින ද සිදු විය. නරි රැළ හූ කියන්නට වූහ. ඒ හඬට රජතුමා අවදි විය. වහාම පුරෝහිතට පණිවිට යවා මාලිගාවට ගෙන්වා ගත්තේ ය. "සීතලෙන් පීඩා විඳින නරි රැළට තවමත් නිවාස තනා, පෙරවීම සඳහා රෙදි සපයා නොදුන්නේ ද ?" රජතුමා පුරෝහිතගෙන් ඇසුවේ ය. "මහරජතුමනි, ඒ සියලු ම දේ ඔබතුමා කිවූ ආකාරයෙන් ම සපයා දුන්නෙමි." පුරෝහිත ගෞරව පූර්වකව පැවසුවේ ය. "එසේ නම් අර නරි රැළ නැවතත් හූ කියන්නේ මන්ද?" රජතුමා පුරෝහිතගෙන් විමසුවේ ය.එවිට පුරෝහිත මෙසේ පිළිතුරු දුන්නේ ය."මහරජතුමනි, ඔබතුමා විසින් නිවාස තනා දීමත්, රෙදි පිළි සපයා දීමත් පිළිබඳ ව නරි රැළ අධික ප්‍රීතියට පත් ව ඇත. ඒ නිසා ඔය කෑගසන්නේ ඔබතුමාට ස්තුති කිරීමට යි." එය ඇසූ රජතුමා ප්‍රීතියට පත් විය.

**පහත සඳහන් වාක්‍ය අනුපිළිවෙළට සකස් කර ලිවීමෙහි සිසුන් නිරත කරවන්න.**

1) රජතුමා පුරෝහිත කැඳවීය.

2) භාණ්ඩාගාරයෙන් මසුරන් දහසක් පුරෝහිතට දුන්නේ ය.

3) කැකිල්ලේ රජතුමා දවසේ වැඩකටයුතු නිම කර නින්දට ගියේ ය.

4)තවත් දිනයක නරි රැළ හූ කියන්නට පටන් ගත්හ.

5)ඔබතුමා කළ උදවුවට ස්තුති කිරීම සඳහා නරි රැළ ප්‍රීති ඝෝෂා පවත්වනවා යැයි පුරෝහිත පිළිතුරු දුන්නේ ය.

6)හිටිහැටියේ අධික ශබ්දයක් ඇසී රජතුමා අවදි විය.

7) ඇසුණු ශබ්දය පිළිබඳ රජතුමා පුරෝහිතගෙන් විමසුවේ ය.

8)නරි රැළට නිවාස සාදා දී රෙදි සපයා දුන්නේ දැයි රජතුමා පුරෝහිතගෙන් විමසුවේ ය.

9)වැස්සට තෙමී සීතලෙන් වෙවුලන නරි රැළක් කෑගසන බව පුරෝහිත පැවසුවේ ය.

10)පුරෝහිත නරි රැළට නිවාස සාදා දී පෙරවීම සඳහා රෙදි සපයන්නට ඇතැයි රජතුමා සිතුවේ ය.